# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.12.07 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2780/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

### 01. හදිසි අනතුරකින් පුද්ගලයෙකු මියයාම - පොතුවිල් පොලිස් වසම.

2025.12.06 වන දින රාත්‍රී කාලයේ පොතුවිල් පොලිස් වසමේ උහන ප්‍රදේශයේ ගල් කොරියක ගල් බෝරයක් පිපිරවීමේදී සිදු වූ අනතුරකින් පුද්ගලයෙකු තුවාල ලබා තිරුක්කෝවිල් රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා අක්කරෙයිපත්තු රෝහලට ඇතුලත් කිරීමෙන් පසු ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇති බවට ලද පණිවිඩයක් මත පොතුවිල් පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 50 ක් වූ උහන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අක්කරෙයිපත්තුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - වාකරේ පොලිස් වසම.

2025.12.06 වන දින උදෑසන කාලයේ වාකරේ පොලිස් වසමේ කජුවත්ත මුහුදු තීරයේ මිරිම් මළ සිරුරක් ඇති බවට වාකරේ පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැති අතර මෘත ශරීරය හඳුනාගත නොහැකි තත්ත්වයට විකෘති වී ඇත.**

මෘත ශරීරය වාලච්චේන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වාකරේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. නීති විරෝධි මත්පැන් හා ගෝඩා සමග සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - මිනුවන්ගොඩ පොලිස් ස්ථානය.

2025.12.06 වන දින දහවල් කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ පන්සිල්ගොඩ ප්‍රදේශයේදී මිනුවන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධි මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 3755 (බැරල් 30) ක් සහ නීති විරෝධි මත්පැන් ලීටර් 90 (බෝතල් 120) ක් හා මත්පැන් පෙරීමට ගන්නා උපකරණ සමඟ සැකකරුවන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 40, 42 හා 45 යන වයස්වල පසුවන කොච්චිකඩේ හා හම්බන්තොට ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරගහහේන පොලිස් ස්ථානය.

2025.12.06 වන දින උදෑසන කාලයේ මොරගහහේන පොලිස් වසමේ කුඩා උඩුව ප්‍රදේශයේදී මොරගහහේන පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 2958 (බැරල් 16) ක් සහ නීති විරෝධි මත්පැන් ලීටර් 675 (බෝතල් 90) සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 40 ක් වන කුඩාඋඩුව, හොරණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරගහහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. නීති විරෝධීව මෙරටට රැගෙන එන ලද සිගරට් තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකය.

2025.12.07 වන අද දින අළුයම් කාලයේ කටුනායක ගුවන්තොටුපල පැමිණීමේ පර්යන්තයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර නීති විරෝධීව මෙරටට රැගෙන ලද සිගරට් 28,000ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 48 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකය මගින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - එරාවූර් පොලිස් වසම.

2025.12.06 වන දින සවස් කාලයේ එරාවූර් පොලිස් වසමේ එරාවූර් කුඩිඉරිප්පු අතුරු මාර්ගයේ වත්තර හන්දිය අසලදී කුඩිඉරිප්පු දෙස සිට එරාවූර් ප්‍රධාන මාර්ගය දෙසට ගමන් කිරීමට පැමිණි කැබ් රථයක යතුරුපැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියයේ පැදිකාරිය, වයස අවුරුදු 10 ක දරුවෙකු හා තවත් කාන්තාවක් තුවාල ලබා එරාවූර් රෝහලට ඇතුලත් කිරීමේදී තුවාල ලැබූ කාන්තාව මියගොස් ඇත. පැදිකාරිය හා දරුවා වැඩිදුර ප්‍රතිකාර සඳහා මඩකලපුව රෝහල වෙත මාරු කර යවා ඇත.

**මරණකාරිය වයස අවුරුදු 42 ක් වූ මීරාකේනි, එරාවූර් ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය එරාවූර් රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කැබ් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර එරාවූර් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - මොරොන්තුඩුව පොලිස් වසම.

2025.12.06 වන දින රාත්‍රී කාලයේ මොරොන්තුඩුව පොලිස් වසමේ ජයවර්ධනපුර මාර්ගයේ කුරුන්ද ග්‍රාම හන්දිය අසලදී බණ්ඩාරගම දෙස සිට කළුතර දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන්

ඉවතට පැන ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු ගෝනදූව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති අතර පසුපැදිකරු බරපතල තුවාල ලබා වැඩිදුර ප්‍රතිකාර සඳහා කළුතර රෝහලට ඇතුලත් කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 25 ක් වූ මඩපාත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගෝනදූව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මොරොන්තුඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**